**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ගණුදෙනු වාර්තාව - 2019**

**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.**

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තීත්‍යයක් විසින්ම එම අස්තීත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තීත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි වන පරිදි කාලසීමාවක් තුළ එම අස්තීත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට සහතික වියයුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්තීත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද, 2003 ජුනි 02 දිනැති අංක ජීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021 මාර්තු 26 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

## 2. විගණන නිරීක්ෂණ

### 2.1 නීතිරීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 110 | හානි පිළිබඳ සටහන් කිරීම උදෙසා නිශ්චිත ආකෘතිය ප්‍රකාරව හානි පිළිබඳව ලේඛණයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | හානි පූර්ණ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොමැති අතර එම ලේඛනය ආරම්භ කිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) මුදල් රෙගුලාසි 395 (ඇ) | 2019 වර්ෂය සඳහා සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශ ආයතනයේ වගකිව යුතු නිලධාරියෙකු | 2019.12.31 දිනට නිසි පරිදි බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | අත්සන් කර නොතිබූ අතර එම බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව **2019** දෙසැම්බර් මාසයේ සිට හඳුනා නොගත් රු.**5,539,787** ක ශේෂයක් පැවතුණි. | නොමැති අතර මුදල් පොත අනුව බැංකු ශේෂය රු.**7,142,089.51** වේ. | |
| **(iii)** මුදල් රෙගුලාසි **1646** | ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත ද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(iv)** මුදල් රෙගුලාසි **1653** | වාහන පාවිච්චි කළ නිලධාරියා විසින් දෛනික ධාවන සටහන් අත්සන් නොකළ අවස්ථා රාශියක් පැවතුණි. | ලේඛනය අත්සන් තැබීම නොපමාව සිදු කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) **2014** පෙබරවාරි **17** දිනැති අංක **01/2014** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | උක්ත චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂය සඳහා ක්‍රියකාරී සැලැස්ම සකස් කිරීමේදී ඔබ විසින් දක්වන ලද අවශ්‍යතාවයයන්ද ඇතුළත් වන පරිදි එය සකස් කරන බව දැනුම් දෙමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) **2016** දෙසැම්බර් **29** දිනැති අංක **30/2016** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේහි **3.1** ඡේදය | ආයතනයේ වාහන සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | අදාල විධිවිධාන අනුව ඉදිරියේදී ඉන්ධන පරීක්ෂාවක් සිදු කිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) **2018** ජනවාරි **24** දිනැති අංක **02/2018** දරනරාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | උක්ත චක්‍රලේඛයේ ඇමුණුම අංක **01** ආකෘතිය පදනම් කරගෙන ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර | **2021** වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කරන බව දැනුම් දෙමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | ඇමුණුම අංක 02 ආකෘතිය පදනම් කරගෙන ආයතනයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | |

**2.2** කළමණාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 6.5 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණ ද එය උපයෝජනය කර නොතිබූ බැවින් සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ඇස්තමේන්තු සැකසීමේ දී ඒවා ඉටුකර ගැනීමට ඇති හැකියාවද සැලකිල්ලට ගත යුතු වේ. |

**2.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව විශේෂ සම්මන්ත්‍රණ යටතේ මහාධිකරණ විනිසුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ 04 ක්, දිස්ත්‍රික් විනිසුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ 06 ක්, මහේස්ත්‍රාත් විනිසුරුවන් සඳහා සම්මන්ත්‍රණ 06 ක් හා ක්වාසි විනිසුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ 02 ක් ලෙස විශේෂ සම්මන්ත්‍රණ 18 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද මහාධිකරණ විනිසුරුවරුන් සඳහා එක් සම්මන්ත්‍රණයක්, අධිකරණ නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ 02 ක් හා ක්වාසි විනිසුරුවරුන් සඳහා එක් සම්මන්ත්‍රණයක් වශයෙන් විශේෂ සම්මන්ත්‍රණ 04 ක් පමණක් පවත්වා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මෙහි හැකියා වර්ධන වැඩසටහන් යටතේ විනිසුරුවරුන් සඳහා ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබූ විනිසුරුවරුන්ගේ අදහස් ඉදිරිපත් කිරීමේ සම්මන්ත්‍රණය | පිළිතුරු ලබාදී නොමැත. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(Presentation Symposium of Judges) හා පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පාඨමාලාව පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

**2.4** ප්‍රසම්පාදන කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 (අ) උප වගන්තිය අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය කැමති නම් සාමාන්‍ය ප්‍රචාරන දැන්වීම් ක්‍රියාපටිපාටියට අමතරව ප්‍රසම්පාදන ආරාධනාවක් වෙබ් අඩවියෙහි පල කිරීම කල හැකි වුවද, 2019 ජනවාරි 12 සහ 13 දිනවල දී ඉන්දියාවේ පැවති පුහුණුව සඳහා සහභාගී වීමට ගුවන් යානාපත් මිලදී ගැනීම සඳහා විද්‍යුත් තැපැල (email) මගින් මිල ගණන් ඉල්ලීම් කර තිබුණි. | මෙම සේවාවේ හදිසි අවශ්‍යතාවය හා ස්වභාවය මත ඊමේල් හරහා මිල ගණන් කැඳවා අදාල ටිකට්පත් මිලදීගෙන ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 (ඇ) වගන්තියට පටහැනිව අවස්ථා 03 ක දී විද්‍යුත් මාධ්‍යයෙන් මිල ගණන් ලබා ගෙන තිබුණි. | මෙම සේවාවේ හදිසි අවශ්‍යතාවය හා ස්වභාවය මත ඊමේල් හරහා මිල ගණන් කැඳවා අදාල ටිකට්පත් මිලදීගෙන ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ආයතනයේ පවත්වනු ලබන වැඩමුළු සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් සහ ආයතනයේ පවිත්‍රතා සේවාව වෙනුවෙන් 2019 ජනවාරි 01 සිට 2019 ජූනි 30 දක්වා ගිවිසුම් වලින් තොරව පිළිවෙලින් රු.103,125 ක් සහ රු.257,303 ක් ගෙවා තිබුණි. | මේ වන විට සේවා ගිවිසුමට එළඹ ගෙවීම් කටයුතු සිදු කරයි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාලීනව සිදුකර සේවා ගිවිසුම් වලට එළඹ ගෙවීම් කලයුතු වේ. |

## 2.5 කාර්ය මණ්ඩල කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ අනුමත නිලධාරීන් සංඛ්‍යාව 24 ක් වූ නමුත් තථ්‍ය කාර්ය මණ්ඩලය 13 ක් වූ හෙයින් සමස්ථ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 11 ක් විය. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 46 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | මේ වන විට පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |